මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.04.01
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් **தொலைபேசி/ தொலைநகல்** Telephone / Fax:- 041-2240208

# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2022.03.08 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 මාර්තු මස මාසික සභා රැස්වීම 2022.03.08 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

## *01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.*

2022.02.08 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

ඒ අනුව 2022.02.08 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

2022.02.23 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව 2022.02.23 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය මගින් අංක G/SP/04/05/1/1 හා 2022.03.07 දිනැතිව “රටේ පවතින විදුලි අර්බුදය හමුවේ විදුලිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම” යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී .
- පාලටුව,මාලිම්බඩ, උඩඉඳුරුකාව,සමිත් හි ඩික්සන් මාලිම්බඩ යන අය විසින් "දිරාපත්වී ඇති ජල බවුසරය සම්බන්ධ" ලිපිය සභාගත කරන ලදී.
- පාලටුව, මාලිම්බඩ, මාලිම්බඩ උතුර ග්‍රාම සංවර්ධන සමිතිය විසින් එවා තිබූ "අගවත්ත සිට ඕගස්ප කම්බි පාලම දක්වා පාර ඇවිදින මන්තීරුවක් ලෙස ඉදිකරවා ගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එවන ලද අංක MLB/HRD/CUL/HR1/9 පොදු හා 2022.02.11 දිනැති "“ මා වැනි බිළින්දා” ඇගයුම් හා රස වින්දන සුයාමය" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, හොරගොඩ, බෝගොඩවත්ත, සමඟි ප්‍රජා මූල සංවිධානය විසින් එවා තිබූ "හොරගොඩ ප්‍රජා මධ්‍යස්ථානයේ කාර්යාල කාමරය සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- හොරගොඩ, පිටවත්ත, 221/ඒ, ආර්.කේ.දිල්හානි ප්‍රියංගිකා යන අය විසින් එවා තිබූ "මීරුප්පගොඩ සිට අකුරුස්ස වැලිගම ප්‍රධාන මාර්ගය දක්වා ඇති අඩි පාර අවහිර කිරීම සම්බන්ධව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ "වීපී පහන් සඳහා කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදීම" යන මැයෙන් විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරන ලදී.
- ගල්පමුණ, සංවර්ධන නිලධාරී, එල්.එල්.කේ.අර්.වික්‍රමරත්න යන අය විසින් එවා තිබූ "භාවිතයට නොගන්නා පොදු ළිං සම්බන්ධව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2022/01/11 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/01/11 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/02/01 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/02/01 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

2022/02/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

2022/02/08 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සකස් කරන ලද වෙබ් අඩවිය හරහා මාර්ග ගත ගෙවීම් (Online Payment) පහසුකම සැලසීම සුදුසු බවටත් ඒ සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සකස් කරන ලද වෙබ් අඩවිය හරහා මාර්ග ගත ගෙවීම් (Online Payment) පහසුකම සැලසීම සුදුසු බවටත් ඒ සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:5</u>**

මාර්ග ගත ගෙවීම් (Online Payment) පහසුකම මගින් ලැබෙන මුදල් ගිණුමගත කිරීම සඳහා මාලිම්බඩ ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම සුදුසු බවටත් එහි චෙක්පත් වල පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච්.අසංකා කුමාරි මිය හා දෙවන අත්සන්කරු ලෙස ජී.එච්.පූර්ණිමා ප්‍රියදර්ශනී මෙනවිය පිළිගැනීම සුදුසු බවටත් ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:5**

මාර්ග ගත ගෙවීම් (Online Payment) පහසුකම මගින් ලැබෙන මුදල් ගිණුමගත කිරීම සඳහා මාලිම්බඩ ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම සුදුසු බවටත් එහි චෙක්පත් වල පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච්.අසංකා කුමාරි මිය හා දෙවන අත්සන්කරු ලෙස ජී.එච්.පූර්ණිමා ප්‍රියදර්ශනී මෙනවිය පිළිගැනීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:6**

1999 වර්ෂයේ සිට හොරගොඩ පොළ බදු දීම සම්බන්ධව ඩබ්.එන්.ඩී.පොන්සේකා යන අයගේ නමින් බදු කුලී ලේඛනවල ඇති රුපියල් 4585.00 ක හිඟ මුදල කපා හැරීමට ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:6**

මෙම හිඟ මුදල 1999 වර්ෂයේ සිට පැවත එන හිඟයක් වන නිසාත්,එම බදු ලේඛනවල හිඟ මුදල සහ බදුකරුගේ නම පමණක් සටහන්ව ඇති නිසාත්, මේ සම්බන්ධව බදුකරු දැනුවත් කිරීමට හැකියාවක් නැත. මෙම හිඟ මුදල ලේඛනගතව පැවතියද ඒ සම්බන්ධව ගිවිසුම් ගත වී තිබේද යන්න සොයා ගත නොහැකි බැවින් නඩු පැවරීමේ හැකියාවක් නොමැත.එබැවින් 1999 වර්ෂයේ සිට හොරගොඩ පොළ බදු දීම සම්බන්ධව ඩබ්.එන්.ඩී.පොන්සේකා යන අයගේ නමින් බදු කුලී ලේඛනවල ඇති රුපියල් 4585.00 ක හිඟ මුදල කපා හැරීමට ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යැවීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:7**

මාතර IV ජල ව්‍යාපෘතියේ මෙහෙයුම් මධ්‍යස්ථානය මාලිම්බඩ කේන්ද්‍රකොට ගෙන තිබෙන බැවින් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ පරිපාලන කාර්යාලය මාලිම්බඩ ප්‍රදේශය කේන්ද්‍රය කොට ආරම්භ කරන ලෙස ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:7**

මාතර IV ජල ව්‍යාපෘතියේ මෙහෙයුම් මධ්‍යස්ථානය මාලිම්බඩ කේන්ද්‍රකොට ගෙන තිබෙන බැවින් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ පරිපාලන කාර්යාලය මාලිම්බඩ ප්‍රදේශය කේන්ද්‍රය කොට ආරම්භ කරන ලෙස සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:8**

සතියකට දින තුනක් වැටුප් ලබා දින 5ක් සේවය කරමින් සහ වැටුප් නොලබා දින දෙකක් සේවයේ යෙදී සිටින පහත නම් සඳහන් අයට දින පහක වැටුප් ගෙවීමට ගරු සභාව යෝජනා කරන්නීය.

i. චතුරිකා මධුමල්කි
ii. ඩී.ඩබ්.මධූෂා කුමාරි
iii. සුභානි සෙව්වන්දි
iv. ආර්.ඒ.කේ.කෞශලා හිමාෂා

v. හෂිනි චාමිකා බෝගොඩ

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:8</u>**
සතියකට දින තුනක් වැටුප් ලබා දින 5ක් සේවය කරමින් සහ වැටුප් නොලබා දින දෙකක් සේවයේ යෙදී සිටින ඉහත නම් සඳහන් අයගෙන් ඩී.ඩබ්.මධූෂා කුමාරි යන අය සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමාගේ නිර්දේශය ලබාගෙන තීරණයක් ලබා දෙන තෙක් පහත නම් සඳහන් අයට පමණක් දින පහක වැටුප් ගෙවීමට තීරණය විය.

i. චතුරිකා මධුමල්කි
ii. සුභානි සෙව්වන්දි
iii. ආර්.ඒ.කේ.කෞශලා හිමාෂා
iv. හෂිනි චාමිකා බෝගොඩ

**<u>යෝජනා අංක 5:9</u>**
කොට්ඨාස මට්ටමින් පත්කරන නිලධාරීන් සඳහා අවශ්‍ය කරන උපකරණ සහා අරමුදලින් මිලදී ගැනීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:9</u>**
කොට්ඨාශ මට්ටමින් පත්කරන නිලධාරීන් සඳහා අවශ්‍ය කරන උපකරණ සහා අරමුදලින් මිලදී ගැනීමට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**
ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ප්‍රාදේශීය සභාවේ සහාය ඇතිව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ පැවැත්වෙන වෙළඳ සංගමය සඳහා සිදු කරන සෞඛ්‍ය සායනයට ප්‍රාදේශීය සභාව මගින් සංග්‍රහ කටයුතු කිරීමට රුපියල් 15000.00 ක මුදල් දැරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:1</u>**
ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ප්‍රාදේශීය සභාවේ සහාය ඇතිව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ පැවැත්වෙන වෙළඳ සංගමය සඳහා සිදු කරන සෞඛ්‍ය සායනයට ප්‍රාදේශීය සභාව මගින් සංග්‍රහ කටයුතු කිරීමට රුපියල් 15000.00 ක මුදල් දැරීමට තීරණය විය

**<u>යෝජනා අංක 6:2</u>**

කාබනික පොහොර ඒකකයේ වැඩ කරන පිරිස්, ප්‍රාදේශීය සභාවේ ඒ සඳහා සම්බන්ධවී වැඩ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් යාමට ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:2</u>**
කාබනික පොහොර ඒකකයේ වැඩ කරන පිරිස්, ප්‍රාදේශීය සභාවේ ඒ සඳහා සම්බන්ධවී වැඩ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් යාමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:3</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අංක YTS – 6208 දරණ ගල්රෝල අළුත්වැඩියා කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

වෙන්දේසි කරන්න හැකියාවක් තිබේ ද යන්න පිළිබඳව ඉංජිනේරු වාර්තාවක් ලබා ගන්න.

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**
වෙන්දේසි කරන්න පුළුවන් නම් අපට පොඩි ගල්රෝලක් මිළදී ගත හැකියි.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**
අලුත්වැඩියාව ඵලදායි නොවන බැවින් සුහද හුවමාරුවක් කර ගන්න පුළුවන්ද බලමු. එසේ කර ගැනීමට හැකියාවක් ඇත්නම් හුවමාරුවේදී ලබාදිය යුතු කොන්දේසි මොනවාද යන්නත් පැහැදිලි වන සේ ඉංජිනේරු වාර්තාව ලබා ගනිමු. හුවමාරු කර ගන්න බැරි වුණොත් අනුමැතියක් ලබා ගෙන වෙන්දේසි කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අංක YTS – 6208 දරණ ගල්රෝල අලුත්වැඩියාව ඵලදායි නොවන බැවින් සුහද හුවමාරුවක් කර ගැනීමටත්, එසේ කර ගැනීමට හැකියාවක් ඇත්නම් හුවමාරුවේදී ලබාදිය යුතු කොන්දේසි මොනවාද යන්නත් පැහැදිලි වන සේ ඉංජිනේරු වාර්තාව ලබා ගැනීමටත්, හුවමාරු කර ගත නොහැකිවුවහොත් අනුමැතියක් ලබා ගෙන වෙන්දේසි කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:4</u>**
සැනසුම, දානපතිවත්ත, අකුරුගොඩ, සුල්තානාගොඩ යන ලිපිනයෙහි පදිංචි ජී.සුසන්ත මනෝජ් යන අය හදිසි අනතුරකට ලක්ව රෝගාතුරව සිටින බැවින්, බදු ගිවිසුමක් යටතේ ඔහු වෙත ලබා දී තිබූ මාලිම්බඩ නව කඩ සංකීර්ණයේ කඩ කාමර අංක 31 සඳහා පවතින

රු.76650.00 ක හිඟ කඩකුළී මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව නිදහස් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:4**

ටෙන්ඩර් පදනම මත ලබාගෙන ඇති මෙම කඩ කාමරයේ එක්වන් මුදල එකවර ගෙවා අවසන් කර ඇති නිසාත්, මොහු මේ වනවිටත් රෝගාතුරව සිටින නිසාත්, කඩ කාමරයේ යතුරු සභාව වෙත නැවත භාරදුන් 2022/01/18 දින තෙක් පවතින රු.76650.00 ක හිඟ කඩකුළී මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීමට තීරණය විය.

**යෝජනා අංක 6:5**

යහලමුල්ල මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:5**

යහලමුල්ල මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:6**

රෝස්වුඩ් ගාර්ඩ්න් අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කාණු පද්ධතිය සකස් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:6**

රෝස්වුඩ් ගාර්ඩ්න් අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කාණු පද්ධතිය සකස් කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:7**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල 2022 වර්ෂයට බදු දීම සඳහා ගාස්තු නියම කිරීමටත් එම දේපළ දෙවන වර ප්‍රාදේශීයව ටෙන්ඩර් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

| විස්තරය |
|---|
| 01. තෙලිජ්ජවිල පොදු වෙළඳ පොළ |
| 02. මාලිම්බඩ පොදු වෙළඳ පොළ |
| 03. මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ඉඩම |
| 04. හොරගොඩ කුරුදු එළදාව ( අවු.03ක් සඳහා ) |
| 05. හොරගොඩ සායන ඉඩම ( අවු.03ක් සඳහා ) |

| | |
|---|---|
| 06. ආදදොළ වත්ත /හොරගොඩ ලිබර්ටි ටෙරස් ඉඩම | |
| 07. ශාන්තිවත්ත ඉඩම | |
| 08. කඩුකන්න වැලිපිටියගෙවත්ත ඉඩම | |
| 09. කොබෙයිමලේ හේන ඉඩම | |
| 10. වෙබීනියාවත්ත ඉඩම | |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

2022 වර්ෂය සඳහා දේපල ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් නොවූ දේපළ පහත අවම ලංසුව යටතේ නැවත ප්‍රාදේශීය වශයෙන් ටෙන්ඩර් කිරීම සුදුසු බවට තීරණය විය.

| අනු අංකය | විස්තරය | අවම ලංසුව (රු ) | ආපසු ගෙවනු ලබන ලංසු තැන්පත් මුදල (රු ) | ආපසු නොගෙවන ලංසු පොරම ගාස්තු ( රු ) |
|---|---|---|---|---|
| 01 | තෙලිජ්ජවිල පොදු වෙළඳ පොළ | 450000.00 | 10000.00 | 250.00 |
| 02 | මාලිම්බඩ පොදු වෙළඳ පොළ | 200000.00 | 5000.00 | 250.00 |
| 03 | මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ඉඩම ( අවු.03ක් සඳහා ) | 60000.00 | 1500.00 | 250.00 |
| 04 | හොරගොඩ කුරුදු එලදාව ( අවු.03ක් සඳහා ) | 2000.00 | 500.00 | 250.00 |
| 05 | හොරගොඩ සායන ඉඩම ( අවු.03ක් සඳහා ) | 6000.00 | 1000.00 | 250.00 |
| 06 | ආදදොළ වත්ත /හොරගොඩ ලිබර්ටි ටෙරන්ස් ඉඩම ( අවු.03ක් සඳහා ) | 15000.00 | 1000.00 | 250.00 |
| 07 | ශාන්තිවත්ත ඉඩම ( අවු.03ක් සඳහා ) | 15000.00 | 1000.00 | 250.00 |
| 08 | කඩුකන්න වැලිපිටියගෙවත්ත ඉඩම ( අවු.03ක් සඳහා ) | 14000.00 | 1000.00 | 250.00 |
| 09 | කොබෙයිමලේ හේන ඉඩම( අවු.03ක් සඳහා ) | 10000.00 | 500.00 | 250.00 |
| 10 | වෙබීනියාවත්ත | 15000.00 | 1000.00 | 250.00 |

**<u>යෝජනා අංක 6:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ප්‍රජා මණ්ඩල විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

| අනු අංකය | ප්‍රජා මණ්ඩලයේ නම | යෝජනාව | ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 01 | ලක්තරු ප්‍රජා මණ්ඩලය - සුල්තානාගොඩ | ශ්‍රමදානය සඳහා JCB යන්ත්‍රයක් ලබා ගැනීම | |
| 02 | සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩලය | ළමා උද්‍යානය පිළිසකර කැ ගැනීම හා ක්‍රීඩා උපකරණ ලබා ගැනීම | 20000.00 |
| 03 | දිරිය ලිය ප්‍රජා මණ්ඩලය | ක්‍රීඩා පිටියක් සඳහා දානපතිවත්ත සභාව සතු ඉඩම පිළිසකර කර ගැනීම | |
| 04 | සරණ ප්‍රජා මණ්ඩලය - පහළ කියාඩුව | 1. ගෙවතු වගාවට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර ලබා ගැනීම.<br>2. ගුණානන්ද මාවත ප්‍රතිසංස්කරණය කර ගැනීම. | |
| 05 | අකුරුගොඩ ප්‍රජා මණ්ඩලය - අකුරුගොඩ නැගෙනහිර | 1, 2 මාර්ග පිළිසකර කර ගැනීම | |
| 06 | ප්‍රගති අපි අකුරුගොඩ දකුණ ප්‍රජා මණ්ඩලය | ආයුර්වේද සායනයක් පැවැත්වීම | 15000.00 |
| 07 | සවිය ප්‍රජා මණ්ඩලය - අකුරුගොඩ නැගෙනහිර | ගෙවතු වගාව සඳහා උපකරණ හා පැල ලබා ගැනීම සඳහා | 20000.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ප්‍රජා මණ්ඩල විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

| අනු අංකය | ප්‍රජා මණ්ඩලයේ නම | යෝජනාව | ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 01 | ලක්තරු ප්‍රජා මණ්ඩලය - සුල්තානාගොඩ | ශ්‍රමදානය සඳහා JCB යන්ත්‍රයක් ලබා ගැනීම | |
| 02 | සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩලය | ළමා උද්‍යානය පිළිසකර කැ ගැනීම හා ක්‍රීඩා උපකරණ ලබා ගැනීම | 20000.00 |
| 03 | දිරිය ලිය ප්‍රජා මණ්ඩලය | ක්‍රීඩා පිටියක් සඳහා දානපතිවත්ත සභාව සතු ඉඩම පිළිසකර කර ගැනීම | |
| 04 | සරණ ප්‍රජා මණ්ඩලය - පහළ කියාඩුව | 1. ගෙවතු වගාවට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර ලබා ගැනීම. | |

| | | | |
|---|---|---|---|
| | | 2. ගුණානන්ද මාවත ප්‍රතිසංස්කරණය කර ගැනීම. | |
| 05 | අකුරුගොඩ ප්‍රජා මණ්ඩලය - අකුරුගොඩ නැගෙනහිර | 1, 2 මාර්ග පිළිසකර කර ගැනීම | |
| 06 | ප්‍රගති අපි අකුරුගොඩ දකුණ ප්‍රජා මණ්ඩලය | ආයුර්වේද සායනයක් පැවැත්වීම | 15000.00 |
| 07 | සවිය ප්‍රජා මණ්ඩලය - අකුරුගොඩ නැගෙනහිර | ගෙවතු වගාව සඳහා උපකරණ හා පැල ලබා ගැනීම සඳහා | 20000.00 |

**<u>යෝජනා අංක 6:9</u>**

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගනු ලැබූ වෙන්දේසි කළ යුතු භාණ්ඩ ලැයිසිතුවෙහි අවම මිළ ගණන් ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:9</u>**

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගනු ලැබූ වෙන්දේසි කළයුතු භාණ්ඩ ලැයිස්තුවෙහි සඳහන් භාණ්ඩ සඳහා ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද අවම ලංසු මුදල පිළිගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:10</u>**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ පොදු කටයුතු සඳහා වෙන් කර ඇති කොටස ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ගයාන් නාදකන්ද මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:10</u>**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ පොදු කටයුතු සඳහා වෙන් කර ඇති කොටස ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට තීරණය විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

- 2022 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු පොදු දේපළ (වත්කම්) සඳහා වූ ටෙන්ඩර් විවෘත කිරීම 2022.02.28 දින පෙ.ව.10.30ට පැවැත්වූ අතර එම ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම.

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු.**

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

අකුරුගොඩ ගමේ ජලය ගලායන ප්‍රධාන මාර්ගය අවහිර කර වෙනස් කිරීම සම්බන්ධවයි යන මැයෙන් ලිපියක් එවල තියෙනවා.නො.147/සී, දැහැමි මාවත, මාලිම්බඩ, පාලටුව යන ලිපිනයේ පදිංචි ගෙදරවත්තගේ තිලකරත්න නැමැත්තා විසින් අකුරුගොඩ ගමේ මාවීදෙණිය ඉඩම් හරහා ජලය ගලා බස්නා ප්‍රධාන ඇල මාර්ගය වෙනස් කර සිලින්ඩර යොදා ඉඩමක් ලෙස සකස් කිරීම හේතුවෙන් ඇල මාර්ගය සම්පූර්ණයෙන් අවහිර වීඇති නිසා වැසි සමයේදී ඊට ඉහලින් ඇති නිවාස සහ ඉඩම් ජලයෙන් යටවීම නිසා ජවතාව පීඩාවට පත්වෙන බව දැනුම් දීල තියෙනවා.

මම ගොවිජන සේවා කාර්යාලයට දැනුම් දුන්නා මේ ගැන වාර්තාවක් දෙන්න කියලා.මේක ගොවිජන සේවා එකට අයිති ඇලක් කියල කියන්නෙ. ප්‍රාදේශීය සභාවට සම්බන්ධීකරණයක් නෑ. ස්ථාන පරීක්ෂණයකට අපි ගියා. ස්ථාන පරීක්ෂණයේදී ගොවිජන සේවා එකෙන් කිව්වා ඇළ හදන්න , නැතිනම් නඩු දානවා කියලා. දැන් ගොවිජන සේවා එකෙන් නඩු දාන්න සූදානම් කරල තියෙන්නෙ. අපිට ඕනනම් ඉල්ලීමක් කරන්න පුළුවන් මේක ක්‍රියාත්මක කරන්න කියලා.

ස්ථානීය පරීක්ෂණයේදී ගත් තීරණය මත ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්තුමිය විසින් තිලකරත්න මහතාට දැනුම්දීල තියෙනවා එම ඇළ මාර්ගය යථා තත්ත්වයට පත් කරන්න කියලා. ඒ අනුව අපි ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් විමසීමක් කරල තියෙනවා එහි වර්තමාන තත්ත්වය අපවෙත දන්වන්න කියලා.

<u>ගරු මන්ත්‍රී ගයාන් නාදකන්ද මහතා</u>

සභාපතිතුමා, ආදම්වත්තෙත්, ගල්පමුණ වෙන්දේසි ඉඩම ළඟත් ලිං දෙක ගැන යෝජනාවක් ඉදිරිපත් කරල තිබුණා. එම ලිං දෙක සභාවේ මෝටරේ දාලා පිරිසිදු කරල දුන්නොත් හොඳයි. ඩෙංගු උවදුර නිසා ඒ ළිං අවට නිවාස වලට බරපතල ගැටළුවක්.

ඒ වගේම RDA එකෙත් ගැටළුවක් තියෙනවා.අපි කතා කළාට එයාල දුරකතනය ගන්නෙ නෑ. ගුණසේකර මාවත සහ ගංගාසිරි මාවත යා කරල කාපට් කරල තියෙනවා. පැතිබැමි ගහන්න වාහන ඇවිල්ල සම්පූර්ණ පාර විනාශ වෙලා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරල RDA එකත් එක්ක කථා කරන්න කියල ඉල්ලනවා.

ඒ වගේම අපි සේවා පියසක් හදන්න ඇස්තමේන්තු හදල තියෙනවා .ඒකට අපිට ලැබෙන මුදලින් අපි ලක්ෂ 20ක් දාලා තියෙනවා . ඒක අපේ සභාව සතු ඉඩමක්. ඒක නිරාකරණය කරල දෙන්න කියලා ඉල්ලනවා. ගොවීන්ගෙ ඉල්ලීම මත කෘෂිවෙල්ල සංවර්ධනයට ලක්ෂ 03 ක් දැම්මා. අපට ඒක සංවර්ධනය කරන්න සහා අරමුදලින් ලක්ෂ 02ක් හෝ ලබා දෙන්න කියල ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී සාගර එදිරිසූරිය මහතා</u>

ගරු සභාපතිතුමනි, අද උදේ සභාවට එනකොට සභා ගර්භය ආසන්නයේදී මගේ කොට්ඨාසයේ මහත්මයෙක් ඇවිල්ල මට ලොකු චෝදනාවක් කළා ඒ අයගේ ඉඩමක් සම්බන්ධව. ඒ ඉඩමට අල්ලපු ඉඩමයි , එයාලගේ ඉඩමයි අතර පැති බැම්මක් බඳින්න ගිහිල්ල TO මහත්මයා ගිහින් විසඳුමක් දීල ආවලු දෙගොල්ල කතා කරල විසඳගන්න කියලා. නමුත්, එසේ තිබියදී සභාපතිතුමා ලියුමක් යවල තියේලු පොලීසියට මේක යොමු කළා කියලා. TO මහතා කියනවා එයා එහෙම නිර්දේශ කළේ නෑ කියලා. ඒ මනුස්සයා මට දොස් කියනවා. මෙයා පොලීසියට ගියාම පොලීසිය අනෙක් පාර්ශ්වයේ පැත්ත අරන් තියෙනවා. මේක අසාධාරණයි සභාපතිතුමා. එහෙම වුණේ කොහොමද කියල මට දැනගන්න ඕන.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

පොලීසිය ලිඛිතව දැනුම් දීමක් කළාම පොලීසියට වාර්තාවක් එවන්න කියලා අපි ලියුමක් යවනවා. මම කවදාවත් පක්ෂග්‍රාහී තීරණ ගන්නෑ.

<u>ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා</u>

පළමුවෙන්ම විශේෂ ස්තුතියක් කරන්න ඕන ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මම වෙනත් පක්ෂයක් නියෝජනය කරත්, ඒ වැඩසටහනට මාව කැඳවගෙන ගිහිල්ල කොට්ඨාසයේ ගරු මන්ත්‍රී මොහොට්ටි මහතාගේ සහභාගීත්වයෙන් අපි මාර්ග නම් කරා. මටත් අවස්ථාව ලැබුණා ඒ මාර්ග කිහිපයක් නම් කරන්න. හැබැයි ඒ වැඩ යෝජනාවට අදාළ ලිපිය 2021 සැප්තැම්බර් මාසයේ සභාවට ලාබිල තියෙනවා , දෙසැම්බර් 15 ට පෙර වැඩ අවසන් කරන්න කියලා. ඔබතුමා මට දුරකතනයෙන් කතා කරල ඒ වැඩ කරන්න කිව්වෙ දෙසැම්බර් 19 වැනිදා. රුපියල් නවසිය ගානට ගන්න තිබුණ සිමෙන්ති අපට ගන්න වුණේ වැඩි මිලට. ඒ ලිපිය ගැන දැනුවත් වුණානම්, අපි එහෙම අපහසුතාවයට පත් වෙන්නෙ නෑ. අපි යෝජනා දෙනවා ඇස්තමේන්තු හදනවා හැබැයි අපේ සමහර වැඩ කෙරෙන්නෙ නෑ. ඉලක්කයක් තිබුණාම වැඩ ටික කෙරෙනවා. දෙසැම්බර් 31 ට ඉවරකරන්න කිව්වාම වැඩ 30 ක් 40 ක් කරා. TO මහත්තය ලොකු කාර්යය භාර්යයක් කරා. එතුමට එන්න බැරිනම් වෙන කෙනෙක් එවනවා. අන්න ඒ වගේ ඉලක්ක සහගත දිනයක් නිසා තමයි වැඩ ටික කෙරුණෙ. හැබැයි අපි කණගාටුවෙනවා, මොකද? කොට්ඨාසයට වැඩ 9ක් 10ක් තිබුණත් අපට වැඩ කරගන්න පුළුවන් වුණේ 03යි. අපිට මුලදි වැඩ කරන්න පුළුවන් වුණානම් දෙසැම්බර් 31 ට ඕනෑම ආයතනයක් අපි දන්නවා මුදල් බේරුම් කරනවා. දැනට පොඩි අවධානමක් තියෙනවා මුදල් ලැබෙයි ද නැද්ද කියලා. කොට්ඨාසවල මුදල් වියදම් කළ අයට ලැබෙන දේ දරා ගන්න වෙනවා. ඒක අපේ අතින් වෙච්ච අඩුපාඩුවක් හැටියට තමයි මම දකින්නෙ. ඒ වගේම ඊට පෙර කරපු කර්මාන්තවල 10% රුඳවුම් සම්බන්ධ බිල්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නොගියපු නිසා ප්‍රමාදයක් වුණා. ඒ නිසා අපට තවත් හිතන්න කාරණාවක් තියෙනවා. සභාපතිතුමනි, නිශ්චිත දිනයක් සහ ඉලක්කයක් දෙනවානම් බොහෝ වැඩ අපට ජයගන්න පුළුවන්.

ඒ වගේම, හිටපු දකුණු පළාත් සභා අමාත්‍ය ගරු මනෝජ් සිරිසේන මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ 2018/2019 වසරවල අප සභාවට ලැබී ඇති ප්‍රතිපාදන වලින් රුපියල් ලක්ෂ 02ක් සඳහා ඉදිරිපත් කර තිබූ යෝජනා මෙතෙක් ඉටුවෙලා නැහැ. ගරු ජනාධිපතිතුමා සභාවේ කාලය දීර්ඝ කළේ නැත්නම් අපේ කාලසීමාවත් ඉවරයි . ඒත් අපට වැඩ කරගන්න බැරිවෙනවා. මම මේ චෝදනා කරනවා නෙවෙයි , වැරදියට තේරුම්ගන්න එපා.මේව අපට කරන්න බැරි වැඩ නොවෙයි. හොරගොඩ කොට්ඨාසයේ මන්ත්‍රීතුමා දැනට මාස ගානකට කලින් පොඩි පාරවල් කොටස් කිහිපයක් යෝජනා කළා. ඒ පාරවල් වල මුල කොටස ඉතිරිවෙලා තියෙනවා. ඒ වගේ ඉතා පහසුවෙන් කරන්න පුළුවන් වැඩ අපේ මොකක්හරි අඩුපාඩුවක් නිසා ප්‍රමාදවෙලා තියෙනවා.

ඇත්තටම කොට්ඨාසයේ මන්ත්‍රීවරු තුන් දෙනාටම දොස් කියනවා සමහර අය.මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉඳලත් පාර හදන්න බැහැයි කියලා. අපට බැරිව නොවෙයි නිවැරදි ඉලක්කයක් දින වකවානුවක් නොමැතිකම නිසා මෙහෙම වෙනව කියන එකයි මගේ අදහස වන්නේ. ඒ නිසා මම කාරුණිකව ඉල්ලනවා මේ කරගන්න බැරිවුණ වැඩ ටික ඔබතුමා දින වකවානුවක් දීල TO මහතාගේ සහයත් ලබා දීල ඉවර කරගන්න සහයෝගය දෙන්න කියලා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ඔබතුමාල මට දීපු යෝජනා ටික සභාවට දාල සම්මත කරල තියෙනවා. සභා වාර්තා බලලා කථා කරන්න. මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව කථා කරල කියල තියෙනවා මේව කරන්න කියලා. ගැටළුව වුණේ ඒක නෙවෙයි. මේ පාර කොන්ත්‍රාත් කරන්න කවුරුවත්ආවෙ නෑ. වාර්තා බැලුවම තේරෙයි. මෙන්න මේ පාරවල් කරන්න කියලා අනුමත කරල තියෙනවා. ඔබතුමාට පුළුවන් අදාළ නිලධාරීන් හමුවෙලා අදාළ තීරණ ක්‍රියාත්මක කරන්න. මං කිසිදේකට අතගහන්නෙ නෑ. තමන්ගෙ අතේ වරදක් තියාගෙන කාටවත් බෝලෙ පාස් කරන්න යන්න එපා. ඒ නිසා මම ඔය කියන කාරණාව දැඩි ලෙස ප්‍රතික්ෂේප කරනවා. හැබැයි ඔබ කිව්ව මනෝජ් සිරිසේන මහතාගේ මුදල්වල ප්‍රමාදයට හේතුව මොකද්ද ? දන්නෑ. මං ඒක බලන්න කියන්නම්. ඒකෙ ප්‍රමාදයක් තිබුණනම් ඒක සභාවෙන් වෙච්ච ප්‍රමාදයක් හැටියට මං භාර ගන්නවා. අනික් ඒවා එකක් වත් මං භාර ගන්නෙ නෑ.

<u>ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා</u>

ඒ වගේම සභාපතිතුමා ප්‍රජා ශාලාවේ තියෙන කාමරයේ යතුරු ගොවිජන සේනා මධ්‍යස්ථානයට ලබා දෙන්න කියලා යෝජනාවක් කරල ලිඛිතව දැනුම් දුන්නා. ගොවිජන සේවා එකෙන් කියනවා යතුරු තියෙන කෙනා ඒක දෙන්න කැමති නෑ කියලා. සභාවෙන් දැනුම්දීමකුත් කරල තියෙනවා. ඒක ක්‍රියාත්මක නොවූ නිසා සභාවෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. නමුත් සභාව ඉන් එහා ගිහින් නෑ. එයාල ගොවි සංවිධානයෙ අයත් නෙමෙයි. බාහිර කණ්ඩායමක් විසින් බඩු ටික තියාගෙන ඉන්නවා. ඒ බඩු කිසිවක් ගමේ අයට ලැබෙන්නෑ.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ලියුමක් හදාගෙන මන්ත්‍රීතුමා ගිහින් ඒකට මැදිහත් වෙන්න. අපි සභාවෙන් යෝජනාවක් ස්ථිර කළාට පස්සෙ අවශ්‍ය ලියකියවිලි අදාළ මන්ත්‍රීවරු මැදිහත්වෙලා හදාගෙන අවශ්‍ය ස්ථානවලට යන්න ඕන. තමන්ම මැදිහත් වෙන්න ඕන. මේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මම ගෙනාපු යෝජනා සභාවෙන් පැත්තකට කළා. ප්‍රාදේශීය ලේකම් පැත්තකට කළා. බලෙන් යෝජනා සම්මත කරගෙන මම ඒවා ක්‍රියාත්මක කළේ. මමත් හරි කැමතියි සභාවෙන් ගන්න යෝජනා ක්‍රියාත්මක වෙනවනම්.

කාරක සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු උසභාපති පී.ජී.පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදයශාන්ත මහතා

මහ සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු උසභාපති පී.ජී.පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

කිරිමැටිමුල්ල උතුර ග්‍රාම සංවර්ධන නිලධාරී සුසිල් පාලිත මහතාගේ මගපෙන්වීමෙන් සහ ගරු මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම්තුමාගේ ආශිර්වාදයෙන් ආරම්භ කර ඇති සංස්කෘතික මධ්‍යස්ථානයෙන් ආරම්භ කළ ගොවිපළට අවශ්‍ය වන කාබනික පොහොර 250 Kg ලබා දෙන ලෙස ඉල්ලීමක් කරල තියෙනවා. මේකට අපේ කිසි සම්බන්ධයක් නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන්නෙ. සල්ලි ගෙවනවා නම් දෙන්න පුළුවන්. මම කිව්වා මේක අපේ අනුග්‍රහයෙන් අපි සම්බන්ධවෙලා ප්‍රජා මණ්ඩලයකින් කරනවානම් දෙන්න පුළුවන් එහෙම

නැත්නම් අනුමැතියක් දෙන්න බෑ කියලා. එහෙම දුන්නොත් හැම සමිතියක්ම ඉල්ලයි. සභාවත් එක්ක සම්බන්ධ ව්‍යාපෘතියකට නම් දෙන්න පුළුවන්.

ඒ වගේම ජල මෝටරය ගැනීම සම්බන්ධ ඇස්තමේන්තු ඇවිත් තියෙනවා. අපි ඉල්ලීමක් කරානෙ අපිට ලැබිල තියෙන්නෙ ලක්ෂ 15 යි. හොරගොඩ ව්‍යාපෘතිය කළොත් ලක්ෂ 09ක් යනවා. අකුරුගොඩට 17 ලක්ෂ ගානක් යනවා.ඇල්ගිරියට පන් ලක්ෂ ගානක් යනවා. අපි ලක්ෂ පහ බැගින් ව්‍යාපෘති 03 ටම ලබා දෙමු.

<u>**ගරු මන්ත්‍රී හර්ෂණී ගුණසේකර මිය**</u>

අද ජාත්‍යන්තර කාන්තා දිනයයි. කාන්තා දිනය වෙනුවෙන් මම කථා කරන්න නැගිට්ටෙ මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මින් ඉහත කවදාවත් නොතිබුණු විදියට කාන්තා මන්ත්‍රීවරියන් හතර දෙනෙක්ට මේ සභාවට එන්න පුළුවන් වුණේ අපි කාන්තාවන් වීම නිසයි. ලෝකයේ ප්‍රථම අගමැතිණිය බිහිවන්නේ ලංකාවෙන්. කාන්තාවන්ගෙන් 50% කටත් වැඩි ප්‍රමාණයක් අද ලංකාවේ ආර්ථිකයට දායක වෙනවා. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 53% කට ආසන්න ප්‍රමාණයක් ඉන්නෙ කාන්තාවන්. එම කාන්තාවන් ප්‍රමාණයෙනුත් 70% කට අධික ප්‍රමාණයක් රාජ්‍ය සේවයේ ඉන්නවා. නමුත් අද කාන්තාවන්ට සිදුවෙලා තියෙනවා අපට හිමිවන්නේ සම තැනද නිසි තැනද කියලා ප්‍රශ්න කරන්න. රටට තාමත් කාන්තාවන්ගේ අවශ්‍යතාවය දැනෙන්නැත්තෙ ඇයි කියන එක මට තේරෙන්නෑ. කාන්තාවන්ව ප්‍රශ්න කරන තත්ත්වයට පත්ව තිබෙනවා.කාන්තා හිංසනය ගැන කතා කරනවා. වර්තමානය වනවිට ආර්ථික , අධ්‍යාපන වගේම මානසික අතින් කාන්තාවන් ඉහල තැනක ඉන්නවා. අධ්‍යාපනය අතින් ඉහළ තත්ත්වයට පත් වුණත්, ලෝකයේ ප්‍රථම අගමැතිණිය ලංකාවෙන් බිහිවුණත්තීන්දු තීරණ ගන්න තැනට කාන්තාවට පත්වෙන්න බැරි ඇයි කියන එක ගැටලුවක්. රටට ජාතියට පවුලට මහඟු සේවයක් කරන කාන්තාවට, ඇයට හිමි ආරක්ෂාව රැකවරණය ගෞරවය ලැබෙනවද කියන එක ගැටළුවක්.

කාන්තාවක් වශයෙන් අපට වගකීමක් තියෙනවා අපේ වගකීම් ඉටුකරන ගමන් අපේ අයිතිවාසිකම් දිනාගන්න.ලංකාවේ කාන්තාවන් වෙනුවෙන් ඇමතිවරයෙක් වත් නැහැ.ඒ වගේම අපේ ප්‍රාදේශීය සභාවේ 90% කට වඩා ඉන්නෙ කාන්තාවො.කාන්තා දිනය වෙනුවෙන් ඔවුන්ට ජෙනරේටරයක් ලබා දෙන්න කියල ඉල්ලනවා.කා න්තාව විශාල කාර්යය භාර්යයක් කරනවා සමාජයට. කාන්තා දිනයේ මම ඉල්ලනවා කාන්තාවන්ට අනුකම්පාව දක්වන්න එපා, එයාලට ආදරය ගෞරවය ආරක්ෂාව දෙන්න කියලා. එතකොට කාන්තාවට සම තැනවත්, නිසිතැනවත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව තීරණය කරන්න ඕන නෑ.

<u>**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**</u>

කාන්තාවන්ට විශේෂ තැනක් දීල තියෙනවා. ඒ ගෞරවය සියලුම කාන්තාවන්ට ලැබිය යුතුයි කියන තැන අපි ඉන්නවා. ඒ වගේම සභාපතිතුමනි, තෙලිජ්ජවිල අපේ කලින් සභාවේ වහලය කැඩෙන්න ගිහින් තියෙනවා ගස් ඇලවෙලා. ඉතා ඉක්මනින් ඒ ගස් කපල ඉවත් කරන්න. කිතුල් ගස් 02 කුත් වැටෙන්න ආසන්නව තියෙනවා. TO මහත්තය යවල ඒවා පරීක්ෂා කරල ඉවත්කිරීමට කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. එහෙම නැත්නම් ලොකු හානියක් වේවි.

ඒ වගේම මාර්ග සංවර්ධන අධිකාරිය, වෙනත් ආයතන හෝ කොන්ත්‍රාත්කරුවන් විසින් යම් යම් සංවර්ධන වැඩ කරන වෙලාවෙදී ඒ කටයුතු කඩිනමින් අවසන් කරන්න කියන්න.

මොකද ? නැතිනම් ජනතාව අපහසුතාවයට පත්වෙනවා. ඒ නිසා මේ නිලධාරීන් යවල පරීක්ෂා කරල ඒව කඩිනම් කරන්න.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව